# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2212/54 - 2021 ජනවාරි මස 29 වැනි සිකුරාදා - 2021.01.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# II වැනි කොටස: අධිකරණ

## ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම්

එල්.ඩී-බී 13/1978 (III)

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

ශ්‍රේෂ්ඨාධිකරණ රීති

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ අග්‍ර විනිශ්චයකාරවරයා විසින් සහ එම ව්‍යවස්ථාව යටතේ ඔහු විසින් නම් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් විනිශ්චයකාරවරයන් විසින් සාදනු ලබන රීති.

ජයන්ත ජයසූරිය,
අග්‍ර විනිශ්චයකාර.

බී. පී. අළුවිහාරේ,
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර.

පී. පද්මන් සූරසේන,
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර.

යසන්ත කෝදාගොඩ,
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර.

2021 ජනවාරි මස 27 වැනි දින,
කොළඹ දී ය.

**රීති**

1. මේ රීති 2021 ශ්‍රේෂ්ඨාධිකරණ (ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම සහ හදිසි ඩිජිටල් අතථ්‍ය නඩු විභාග) (විශේෂ විධිවිධාන) රීති යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2021 පෙබරවාරි මස 15 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු ය.


1A - G 33621 — 50 (2021/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. (මෙහි මින්මතු "පවත්නා රීති" යනුවෙන් සඳහන් කරනු ලබන) කලින් කලට සංශෝධිත, 1991 ජුනි මස 7 වැනි දින අංක 665/32 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1990 ශ්‍රේෂ්ඨාධිකරණයේ රීතිවල විධිවිධානවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව මේ රීති -

(අ) ඉල්ලීම්, අභියාචන, මෝසම් සහ එම ඉල්ලීම් සහ අභියාචනවලට අදාළ වෙනත් ලේඛන ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉලෙක්ට්‍රොනිකව ගොනු කිරීම සඳහා, සහ

(ආ) 3 වන රීතිය ප්‍රකාරව හදිසි යයි සලකනු ලබන, මේ රීති හෝ පවත්නා රීති යටතේ ගොනු කරන ලද ඉල්ලීම්, අභියාචන සහ මෝසම් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් හදිසි ඩිජිටල් අතථ්‍ය නඩු විභාග පැවැත්වීම සඳහා,

අදාළ විය යුතුය.

3. ජාතික ආරක්ෂාව, මහජන ආරක්ෂාව හෝ ශ්‍රේෂ්ඨාධිකරණ පරිශ්‍රය තුළ යථා පැවැත්ම සහ ආරක්ෂාව කෙරෙහි අගතිගාමී වන යම් හේතුවක් මත සාම්ප්‍රදායික භෞතික නඩු විභාග පැවැත්වීමට ඇති නොහැකියාව සහ එකී නොහැකියාව පවතින අතරතුර හදිසි නඩු කටයුතුවල දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් යුක්තිය පසිඳලීම දුෂ්කරතාවකින් තොරව සහ බාධා රහිතව පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් මේ රීති යටතේ හෝ පවත්නා රීති යටතේ ගොනු කරන ලද යම් ඉල්ලීමක්, අභියාචනයක් හෝ මෝසමක් පිළිබඳ, මේ රීති යටතේ (මෙහි මින්මතු "ඩිජිටල් නඩු විභාගය" යනුවෙන් සඳහන් කරනු ලබන) හදිසි ඩිජිටල් අතථ්‍ය නඩු විභාගයක් පැවැත්වීම අවශ්‍ය වන බවට අග්‍රවිනිශ්චයකාරවරයා විසින් තත් කාර්ය සඳහා නම් කරන ලද ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් සලකනු ලබන්නේ නම්, එම ඉල්ලීම, අභියාචනය හෝ මෝසම හදිසි යයි සලකනු ලැබිය යුතු ය.

4. (1) යම් ඉල්ලීමක් හෝ අභියාචනයක් ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉලෙක්ට්‍රොනිකව ගොනු කිරීමට අදහස් කරන යම් තැනැත්තකු හෝ පවත්නා රීති යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ දැනටමත් ගොනු කරන ලද ඉල්ලීමකට හෝ අභියාචනයකට අදාළ වෙනත් ලේඛන ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉලෙක්ට්‍රොනිකව ගොනු කිරීමට අදහස් කරනු ලබන ඒ ඉල්ලීමේ, අභියාචනයේ පාර්ශ්වකරුවකු, ඔහු විසින් ම හෝ ඔහු වෙනුවෙන් කටයුතු කරන නීතිඥවරයකු මගින් ඒ ඉල්ලීම, අභියාචනය හෝ වෙනත් ලේඛන, අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් විනිශ්චයකාරවරයන් අමතන මෝසමක් සමග (මෙහි මින්මතු "රෙජිස්ට්‍රාර්වරයා" යනුවෙන් හඳුන්වනු ලබන) ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉලෙක්ට්‍රොනික තැපැල හරහා ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) (අ) ඩිජිටල් නඩු විභාගයක් පවත්වනු ලැබීම අපේක්ෂා කරන (මෙහි මින්මතු "පාර්ශ්වකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉල්ලුම්කරුවකු, අභියාචකයකු හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ පවතින යම් නඩු කටයුත්තකට හෝ කාරණයකට අදාළ වෙනත් පාර්ශ්වකරුවකු විසින්, (1) වන අනු රීතියේ නිශ්චිතව දක්වා ඇති පරිදි ඔහු විසින් ම හෝ ඔහු වෙනුවෙන් කටයුතු කරන නීතිඥවරයකු හරහා, මෝසමක් ඉලෙක්ට්‍රොනිකව ගොනු කරනු ලැබිය යුතු ය.

(ආ) ස්වකීය ඉල්ලීම, අභියාචනය හෝ මෝසම ඩිජිටල් නඩු විභාගයක් මගින් විමසීමේ අවශ්‍යතාව පෙන්වන්නා වූ ද, එවැනි නඩු විභාගයක් පැවැත්වීම සාධාරණීයකරණය කරන්නාවූ ද හේතුව, වෙනත් කරුණු අතර, නිශ්චිතව හා සවිස්තරාත්මකව එම මෝසමේ සඳහන් කරනු ලැබිය යුතු අතර ඩිජිටල් නඩු විභාගය සඳහා වන කටයුතු සූදානම් කිරීමට රෙජිස්ට්‍රාර්වරයා විසින් සම්බන්ධ කරගනු ලැබිය හැකි, ඩිජිටල් නඩු විභාගයක් අපේක්ෂා කරන පාර්ශ්වකරුගේ සම්පූර්ණ නම සහ ඉලෙක්ට්‍රොනික තැපැල් ලිපිනය සහ ජංගම දුරකථන අංකය ඇතුළු එම තැනැත්තාගේ සම්බන්ධ කරගැනීමේ විස්තර හෝ නීතිඥවරයෙකුගේ එම විස්තර එම මෝසමේ අන්තර්ගත විය යුතු ය.

(3) පවත්නා රීතිවල, විධිවිධාන, මේ රීති සමග අනනුකූල නොවනතාක් දුරට එම විධිවිධාන (1) වන හා (2) වන අනු රීතිවල සඳහන් සෑම ඉල්ලීමකට ම, අභියාචනයකට ම, මෝසමකට ම හෝ වෙනත් ලේඛනයකට ම අදාළ විය යුතු ය.

(4) (1) වන හා (2) වන අනු රීතිවල සඳහන් සෑම ඉල්ලීමක් ම, අභියාචනයක් ම, මෝසමක් ම හෝ වෙනත් ලේඛනයක් ම -

(අ) ඒ4 (A4) ප්‍රමාණයේ පිටු සැකැස්මක වම් පසින් හා දකුණු පසින් සෙන්ටිමීටර් 4ක ඉඩ ප්‍රමාණයක් ද, ඉහළින් සහ පහළින් සෙන්ටිමීටර් 2ක තීරයක් ද තබා 12 ප්‍රමාණයේ ටයිම්ස් නිව් රෝමන් අක්ෂර යොදාගෙන, පේළි අතර පරතරය 1.5ක් වන සේ න පරිගණක ගතකොට තිබිය යුතු ය ;

(ආ) අවශ්‍ය අවස්ථාවල දී අත්සන් හෝ සහතික කිරීම් ඇතුළත්වන සේ පවත්නා රීතිවලට අනුකූල වන ලේඛන ද, ඒ සමග ඉදිරිපත් කළ යුතු ය ;

(ඇ) කිසිදු දිය සළකුණක් නොමැතිව සකස් කර සහ "ස්කෑන්" (Scan) කර තිබිය යුතු අතර හැකි සෑම අවස්ථාවකදීම "ඔප්ටිකල් කැරැක්ටර් රෙකග්නිෂන්" (optical character recognition - OCR) අනුව අඟලකට ඇති තිත් (dpi) ගණන 300ක් විය යුතු ය ;

(ඇ) හැකි සෑම අවස්ථාවක දී ම, ආවරණ මෝසමෙන් ආරම්භ වී සෑම පිටුවක ම යටින් පිටු අංකය යොදා ඇති එකම පිටු මාලාවක් සහිත "පෝටබල් ඩොකියුමන්ට් ෆෝමැට්" (portable document format - PDF) ගොනුවක් වන තනි ලේඛනයක් ලෙස සංගතකොට තිබිය යුතු ය ; සහ

(ඉ) ඉල්ලීමක්, අභියාචනයක්, මෝසමක්, වෙනත් ලේඛන හෝ ඒ යටතේ වන ඇමුණුම්, මෙගා බයිට් 20 ගොනු ප්‍රමාණය ඉක්මවන අවස්ථාවක දී, එකී ඉල්ලීම, අභියාචනය, මෝසම, වෙනත් ලේඛන හෝ ඇමුණුම්, ගොනුවේ නියමිත ප්‍රමාණය ලබා ගැනීම සඳහා නියම කරනු ලැබිය හැකි පරිදි PDF ලේඛන කීපයකට වෙන් කරනු ලැබිය යුතු අතර ඉලෙක්ට්‍රොනික තැපැල හරහා එක් වරකට හෝ කිහිප වරකට යොමු කිරීම හෝ "ක්ලවුඩ් ස්ටෝරේජ්" (cloud storage) වැනි සුදුසු දත්ත ගබඩා කිරීමේ වෙබ් පාදක කොටගත් යාන්ත්‍රණයක ගබඩා කිරීම කළ යුතු අතර ඉලෙක්ට්‍රොනික තැපැල හරහා එම ගබඩා කිරීමේ යාන්ත්‍රණයට අවශ්‍ය ප්‍රවේශය රෙජිස්ට්‍රාර්වරයාට ලබාදිය යුතු ය.

(5) මේ රීති ප්‍රකාරව ලේඛන ඉලෙක්ට්‍රොනිකව ගොනු කරන්නා වූ පාර්ශ්වකරු හෝ නීතිඥවරයා විසින්, එසේ ගොනු කරන ලද එම ලේඛනවල දෘඪ පිටපත්, අවස්ථාවෝචිත පරිදි, එකී පාර්ශ්වකරු හෝ නීතිඥවරයා විසින් තමා භාරයේ සුරක්ෂිතව තබාගත යුතු අතර ශ්‍රේෂ්ඨාධිකරණයේ විධානය මත එම ලේඛන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

5. (1) අග්‍ර විනිශ්චයකාරවරයා විසින් තත් කාර්යය සඳහා නම් කරන ලද, නිල කුටියෙහි ආසනාරූඪ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයා විසින්, 4 වන රීතිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉලෙක්ට්‍රොනිකව ගොනු කරන ලද මෝසම් පිළිබඳ සලකා බලනු ලැබිය යුතු අතර අවශ්‍ය අවස්ථාවක දී ඒ සමග ගොනු කරන ලද ඉල්ලීම්, අභියාචන හෝ වෙනත් ලේඛන පිළිබඳව ද සලකා බලා එම ඉල්ලීම්, අභියාචන හෝ මෝසම්, ඩිජිටල් නඩු විභාගයට භාජනය කරනු ලැබිය යුතු ද යන වග තීරණය කරනු ලැබිය යුතු ය.

(2) ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉලෙක්ට්‍රොනිකව ගොනු කරන ලද යම් මෝසමකට අදාළ කාරණය 3 වන රීතියේ අර්ථානුකූලව හදිසි කාරණයක් බවද, එකී කාරණය ඩිජිටල් නඩු විභාගයක් සඳහා යොමු කිරීම යෝග්‍ය බවද එකී විනිශ්චයකාරවරයා සෑහීමට පත්වන ලෙස පෙනී යන අවස්ථාවක, ඒ කාරණාවට අදාළව ඩිජිටල් නඩු විභාගයක් පැවැත්වීම සඳහා කටයුතු පිළියෙල කරන ලෙස ඔහු විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත උචිත විධානයක් කරනු ලැබිය යුතු ය.

(3) ඩිජිටල් නඩු විභාගයක් පැවැත්වීම සඳහා කටයුතු පිළියෙල කිරීම පිණිස, 6 වන රීතියේ නිශ්චිතව දක්වා ඇති විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම, රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යය විය යුතු ය.

6. (1) රෙජිස්ට්‍රාර්වරයා විසින් -

(අ) ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම සහ ඩිජිටල් නඩු විභාගය සම්බන්ධයෙන් අදාළ වන ගාස්තු ගෙවා එකී ගෙවීම සිදු කරනු ලැබූ බව ඔප්පු කිරීමට අදාළ සාක්ෂි රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරන ලෙස ද ;

(ආ) රෙජිස්ට්‍රාර්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන ආකාරයෙන් එකී ඉල්ලීම, අභියාචනය හෝ මෝසම ගොනු කිරීම සම්බන්ධයෙන්, එකී ඉල්ලීමට හෝ අභියාචනයට අදාළ පාර්ශ්වකරුවන් වෙත දැනුම් දී එකී දැන්වීම ලබාදුන් බව ඔප්පු කිරීමට අදාළ සාක්ෂි රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරන ලෙස ද,

අදාළ පාර්ශ්වකරුට හෝ අදාළ පාර්ශ්වකරු විසින් නම් කරනු ලැබ ඇති නීතිඥවරයාට නියම කරනු ලැබිය යුතු ය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, අදාළ පාර්ශ්වකරු හෝ නීතිඥවරයා විසින් (1) (අ) අනු රීතියට අනුකූලව කටයුතු කරනු ලැබ ඇති බවට සෑහීමට පත් වුවහොත් මිස, එකී ඉල්ලීම, අභියාචනය හෝ මෝසම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම කරනු නොලැබිය යුතු ය.

(3) පළමු අවස්ථාවේ දී මේ රීතියේ ඉහතින් වූ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම එකී පාර්ශ්වකරු හෝ නීතිඥවරයා විසින් පැහැර හැරි අවස්ථාවක, ඒ පාර්ශ්වකරු හෝ නීතිඥවරයා වෙත ඉලෙක්ට්‍රොනික් තැපැල් මාර්ගයෙන් යවන දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ දක්වා ඇති කාලසීමාව ඇතුළත ඔහු විසින් මේ රීතියට අනුකූලව කටයුතු කරනු ලැබුවහොත් මිස ඔහුගේ ඉල්ලීම, අභියාචනය හෝ මෝසම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනු නොලබන බව රෙජිස්ට්‍රාර්වරයා විසින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

(4) රෙජිස්ට්‍රාර්වරයාගේ දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත එකී දැන්වීමට අනුකූලව කටයුතු කිරීම අදාළ පාර්ශ්වය හෝ නීතිඥවරයා පැහැර හැරි අවස්ථාවක උචිත විධානයක් කිරීම සඳහා ඉල්ලීම, අභියාචනය හෝ මෝසම 5 වන රීතියේ සඳහන් විනිශ්චයකාරවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) 4 වන රීතිය යටතේ ගොනු කරන ලද යම් මෝසමක් ඩිජිටල් නඩු විභාගයක් මගින් විභාගයට ගනු ලැබීම අවශ්‍ය බවට 5 වන රීතියේ (2) වන අනු රීතිය යටතේ තීරණය කර ඇත්තා වූ ද, අවස්ථාවෝචිත පරිදි, අදාළ පාර්ශ්වකරු හෝ නීතිඥවරයා විසින් මේ රීතියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කරනු ලබන්නා වූ ද අවස්ථාවක, 5 වන රීතියේ සඳහන් විනිශ්චයකාරවරයාගේ විධානය මත රෙජිස්ට්‍රාර්වරයා විසින් ඩිජිටල් නඩු විභාගය පැවැත්වීම සඳහා දිනයක් සහ වේලාවක් නියම කරනු ලැබිය යුතු ය.

(6) ඩිජිටල් නඩු විභාගය පැවැත්වීම සඳහා නියම කරන ලද දිනය සහ වේලාව එකී නඩු කටයුත්ත හෝ කාරණය විභාග කිරීම සඳහා අග්‍ර විනිශ්චයකාරවරයා විසින් නම් කරන ලද විනිශ්චයකාරවරයන් වෙත ද, අවස්ථාවෝචිත පරිදි, අදාළ පාර්ශ්වයන් හෝ ඔවුන්ගේ නීතිඥවරයන් වෙත ද ඉලෙක්ට්‍රොනික තැපැල් මාර්ගයෙන් හෝ දුරකථනයෙන් දන්වනු ලැබිය යුතු ය.

7. (1) ඩිජිටල් නඩු විභාගයක් යථා පරිදි පවත්වනු ලබන බවට වගබලා ගැනීමේ අරමුණින්, සෑම පාර්ශ්වයක් විසින් ම -

(අ) ඩිජිටල් නඩු විභාගය රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන සමාකාලීන හෝ ආසන්න සමකාලීන අන්තර්ජාලය පාදක කොටගත් "වීඩියෝ සම්මන්ත්‍රණ වේදිකාවක" දී (Video Conferencing Platform) පවත්වනු ලබන බවට ;

(ආ) තමා ඩිජිටල් නඩු විභාගයට සහභාගී වන අවස්ථාවේ දී වෙබ් කැමරාවක් (webcam), මයික්‍රොෆෝනයක් (microphone) සහ ස්පීකරයක් (speaker) සහිත නිසි පරිදි ක්‍රියා කරන පරිගණකයක් සහිතව සිටින බවට ;

(ඇ) ඩිජිටල් නඩු විභාගයට සහභාගී වීමේදී සුදුසු සහ නිශ්ශබ්ද ස්ථානයක් භාවිත කරනු ලබන බවට ද, තමා පිටුපසින් විස්තරාත්මක නොවන තනි පාට පසුබිමක් තිරයේ දිස්වන ස්ථානයක ස්ථානගත වන බවට ද ;

(ඈ) ඩිජිටල් නඩු විභාගය ආරම්භ කිරීම සඳහා සියලු පාර්ශ්වකරුවන් අතර අන්තර්ජාල සම්බන්ධතාව සහ ජාලය නිසි පරිදි ක්‍රියාකරන්නේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා ඩිජිටල් නඩු විභාගය සඳහා නියම කරන ලද වේලාවට යටත් පිරිසෙයින් මිනිත්තු පහළොවකටවත් පෙරාතුව තමා මාර්ගගතව සිටින බවට ද,

වගබලා ගත යුතු ය.

(2) ඩිජිටල් නඩු විභාගයට සහභාගී වන නීතිඥවරයකු විසින් "ප්‍රදර්ශනය වන නම" ලෙස වාසගම සහිතව ඔහුගේ නම භාවිත කරනු ලැබිය යුතු ය.

8. (1) පහත දැක්වෙන තැනැත්තන් ඩිජිටල් නඩු විභාගයකට සහභාගීවීම සඳහා හිමිකම් ලැබිය යුතු ය :

(අ) අදාළ පාර්ශ්වකරුවන්ගේ නීතිඥවරයන් ;

(ආ) එම නීතිඥවරයන් විසින් භාවිත කරනු ලබන පරිගණකය පෙනෙන පරිදි රැඳී සිටිමින් ඩිජිටල් නඩු විභාගයේ නඩු කටයුතු නිරීක්ෂණය කරනු ලැබීමට හැකියාව තිබෙන්නාවූ ද, ස්වකීය නීතිඥවරයන් මාර්ගයෙන් ඒ සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසරය ලබාගෙන ඇත්තාවූ ද, ඉල්ලීමට, අභියාචනයට හෝ මෝසමට අදාළ පාර්ශ්වකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ;

(ඇ) නීතිඥවරයකු මගින් ඉදිරිපත් නොවන ඉල්ලීමට, අභියාචනයට හෝ මෝසමට අදළ පාර්ශ්වකරුවන් ; සහ

(ඈ) ශ්‍රේෂ්ඨාධිකරණයේ නිලධරයන්.

(2) ඩිජිටල් නඩු විභාගයේ නඩු කටයුතු ආරම්භ කිරීමට පෙරාතුව, වීඩියෝ රාමුව තුළ නිරූපණය නොවන තැනැත්තන් පිළිබඳ විස්තර ද ඇතුළුව සියලු පාර්ශ්වකරුවන් විසින් ඔවුන්ගේ නම්, හඳුනා ගැනීමේ විස්තර සහ සම්බන්ධ කර ගැනීමේ විස්තර රෙජිස්ට්‍රාර්වරයා වෙත දන්වනු ලැබිය යුතු ය :

එසේ වුවද, පැමිණ සිටින සියලු තැනැත්තන් පරිගණකයේ වෙබ් කැමරාවේ පරාසය තුළ අසුන් ගැන්වීමට හැකි සෑම ප්‍රයත්නයක්ම දරනු ලැබිය යුතු ය.

(3) සහභාගීවීම සඳහා හෝ පැමිණ සිටීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ පූර්ව අවසරය ලබා ගෙන ඇත්නම් මිස, කිසිම තැනැත්තකු ඩිජිටල් නඩු විභාගයකට සහභාගීවීම හෝ ඩිජිටල් නඩු විභාගයක් පෙනෙන පරිදි පැමිණ සිටීම සිදු නොකළ යුතු ය.

(4) අධිකරණයේ පූර්ව අවසරය ලබා නොගෙන කිසිම තැනැත්තකු විසින් අධිකරණය ඇමතීම හෝ අධිකරණයේ අවධානය පිණිස යම් දෙයක් ප්‍රදර්ශනය කිරීම සිදු නොකළ යුතු ය.

(5) අධිකරණයෙන් පූර්ව අවසරය ලබාගෙන ඇත්නම් මිස, ඩිජිටල් නඩු විභාගය අතරතුර සෑමවිටකදී ම පරිගණකයේ වෙබ් කැමරාව සහ වීඩියෝ සම්මන්ත්‍රණ වේදිකාවේ "වීඩියෝ ඔප්ෂන්" (video option) ක්‍රියාත්මකව තබා ගැනීමට පාර්ශ්වකරුවන් වගබලා ගත යුතු ය.

(6) සම්පූර්ණ ඩිජිටල් නඩු විභාගයක් හෝ ඉන් කොටසක් වීඩියෝ, ශ්‍රව්‍යමය, ඩිජිටල් හෝ වෙනත් යම් ආකාරයකින් වාර්තාගත කිරීම, පිටපත් කිරීම, ගබඩා කිරීම, බෙදා හැරීම, ප්‍රචාරය කිරීම, විකාශනය කිරීම හෝ අන්‍යාකාරයෙන් සම්ප්‍රේෂණය කිරීම සියලු තැනැත්තන්ට සපුරා තහනම් වන්නේ ය.

(7) ඩිජිටල් නඩු විභාගයකට සහභාගී වන සියලු පාර්ශ්වකරුවන්, අධිකරණය විසින් එකී නඩු විභාගය අවසන් කරනු ලබන තෙක් මාර්ගගතව රැඳී සිටිය යුතු ය.

එසේ වුවද, අධිකරණයේ පූර්ව අවසරය ඇතිව යම් පාර්ශ්වයක් විසින් ඩිජිටල් නඩු විභාගයට තමා සහභාගී වන ස්ථානයෙන් ඉවත්ව යාම හෝ "වීඩියෝ ඔප්ෂන්" (video option) ක්‍රියාවිරහිත කිරීම කරනු ලැබිය හැකි ය.

(8) යම් පාර්ශ්වකරුවකුට තාක්ෂණික සහාය අවශ්‍ය වන යම් ගැටළුවකට මුහුණ දීමට සිදු වුවහොත්, එකී ගැටළුව නිරාකරණය කරන තෙක් හෝ අධිකරණයේ අවසරය ඇතිව විකල්ප ක්‍රමයක් ක්‍රියාත්මක කරන තෙක් ඩිජිටල් නඩු විභාගය අඩාලව කල් තැබීම සඳහා ඒ පාර්ශ්වකරු විසින් අධිකරණයෙන් අවසර ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(9) ඩිජිටල් නඩු විභාගයක් ආරම්භ කරන ලද හෝ ඩිජිටල් නඩු විභාගයක් පවත්වන ලද ඉල්ලීමකට, අභියාචනයකට හෝ මෝසමකට අදාළ නඩු කටයුතු එකී ඩිජිටල් නඩු විභාගයේ ඉදිරි නඩු වාරයක් ලෙස හෝ සාම්ප්‍රදායික භෞතික නඩු විභාගයක් ලෙස හෝ පසුව ඉදිරියට පවත්වාගෙන යනු ලැබිය හැකි ය.

9. සෑම ඩිජිටල් නඩු විභාගයක්ම හැකි උපරිම මට්ටමෙන්, ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු විභාග සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් අදාළ වන ශ්‍රේෂ්ඨාධිකරණයේ පවත්නා රීතිවලට අනුකූලව පවත්වනු ලැබිය යුතු අතර එවැනි යම් විභාගයක් විනිශ්චයකාරවරයන්ගේ සහ 8 වන රීතියේ (1) වන අනුරීතියේ සඳහන් තැනැත්තන්ගේ භෞතික සහභාගීත්වය ඇතිව ශ්‍රේෂ්ඨාධිකරණයේ දී පවත්වනු ලබන නඩු කටයුත්තක් ලෙස සලකනු ලැබිය යුතු ය.

10. මේ රීතිවල කාර්ය සඳහා "වෙනත් ලේඛන" යන්නට විරෝධතා, ප්‍රතිදිවුරුම් ප්‍රකාශ, ලිඛිත දේශන සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් නඩු කටයුත්තක් හෝ කාරණයක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කිරීමට අවසර දෙන ලද වෙනත් යම් ලේඛන ඇතුළත් වේ.

02 - 249

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.